# තනතුරු පුරප්පාඩු

සීමාසහිත ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අංක 06/2022 චක්‍රලේඛ අනුව මූලික සුදුසුකම් සපුරා ඇති සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) - II&I හා සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) II&I තනතුරු සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිය ඇති වයස අවුරුදු 18/45 ත් අතර අයවලුන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ. (දැනට සමුපකාර සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව බලපානු නොලැබේ.)

සියලුම අයදුම්කරුවන් 2024.05.17 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ගරු සභාපති, සීමාසහිත ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතිය, නො. 1/78, නුවර පාර, ගම්පොල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැකි අතර, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

මූලික සුදුසුකම් සියලු විස්තර සමිති කාර්යාලයෙන් හෝ ආසන්න විවිධ සේවා සමුපකාර සමිතියකින් ලබාගත හැකිය.

**සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු)** - II & 1

1. පුරප්පාඩු ගණන : 01
2. වැටුප් පරි.අංකය : E.L. - 02:02
3. වැටුප් පරිමාණය : 30000-600x10-900x10 - 1200 x10 = 57000/-
4. වයස් සීමාව : අවු.18-45

**සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)** - II & 1

1. පුරප්පාඩු ගණන : 01
2. වැටුප් පරි.අංකය : E.L. 02:01
3. වැටුප් පරිමාණය : 30000-600x10-900x10 -1200 x10 = 57000/-
4. වයස් සීමාව : අවු.18-45

මෙයට අමතරව සියලුම තනතුරු සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් අනුමත දීමනා හා විශ්‍රාම දායකත්වය වැටුප් හිමිකම් ද ලබාදෙනු ඇත. සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතික, උප්පැන්න සහතිකය, සේවා සහතිකය හා අනෙකුත් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතු අතර ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ ඉල්ලුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**මෙයට,**
**සමුපකාරික,**

**සාමාන්‍යාධිකාරී,**
**සී/ස ගම්පොළ විවිධ සේවා සමුපකාර සමිතිය,**
**නො. 1/78, නුවර පාර, ගම්පොළ.**